# වයඹපළාත්සෞඛ්‍යසේවාදෙපාර්තමේන්තුව
## வடமேல்மாகாணசுகாதாரசேவைகள்திணைக்களம்
## Department of Health Services – Northwestern Province

සෞඛ්‍යසංකීර්ණය. சுகாதாரவளாகம் Health Complex.
මීගමුපාර, நீர்கொழும்புவீதி Negombo Road,
குருநாகல் 60000 Kurunegala. 60000

Web : www.healthdept.nw.gov.lk
E-Mail : info@healthdept.nw.gov.lk


මගේඅංකය
எனதுஇல :NWP/PDHS/F10/ගස/පොදු ලිපි/2020
My No

ඔබේඅංකය
உமதுஇல. :
Your No

දිනය
திகதி :
Date 2022.11.09

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
ප්‍රදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
කුරුණෑගල / පුත්තලම,
වෛද්‍ය අධිකාරීවරුන්,
සියළුම ආයතන ප්‍රධානීන්.

**<u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය - 2022</u>**

වයඹ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලුම රෝහල් හා ආයතන විසින් පළාත් මුල්‍ය රීති 476 ප්‍රකාරව පොදු භාණ්ඩ , ශල්‍ය භාණ්ඩ හා වාහන සම්බන්ධයෙන් වෙන වෙනම 2022 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කල යුතුය.පළාත් මුල්‍ය රීති 476 (3) සඳහන් පරිදි මෙම සමීක්ෂණ මණ්ඩලයට හරි වැරදි බැලීම සඳහා සෞඛ්‍ය 1196 ආකෘති පත්‍රය යොදා ගත යුතු අතර පාවිච්චියට ගත නොහැකි බඩු ගැන වාර්තා කිරීම සඳහා පොදු 47 ආකෘති පත්‍රය භාවිතා කළ යුතුය.

**02.භාණ්ඩ සමීක්ෂණය සිදු කළ යුතු කාල රාමුව**

**02.i** 2021.08.05 දිනැති පළාත් භාණ්ඩාගාර (මුල්‍ය ) චක්‍රලේඛ අංක 01/2021 සඳහන් පරිදි පළාත් මුල්‍ය රීති සංශෝධනය කරමින් නිකුත් කරන ලද චක්‍රලේඛය ප්‍රකාරව පළාත් මුල්‍ය රීති 476.5 අනුව මෙම කටයුතු කළ යුත කාල රාමුව සඳහන් කර ඇති අතර , ඒ අනුව සකසන ලද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අදාල කාල රාමුව පහත දක්වා ඇත.

| අනු:අං | කාර්යය | කාල රාමුව |
|---|---|---|
| 01. | 2022 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම. | 2022 දෙසැම්බර් 15 දිනට පෙර |
| 02. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු භෞතිකව අවසන් කිරීම. | 2023 මාර්තු 15 දිනට පෙර |
| 03. | පත් කරණ ලද සමීක්ෂණ මණ්ඩලය විසින් භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීම. | 2023 මාර්තු 31 දිනට පෙර |
| 04. | අංක 03 හි සඳහන් භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පරිදි ඌණතා හා අතිරික්තතා වාර්තා කිරීම හා ක්‍රියාමාර්ග | 2023 අප්‍රේල් 15 දිනට පෙර |

| | | |
|---|---|---|
| | ගැනීම | |
| 05. | පොදු 47 වාර්තාවේ සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු සිදු කිරීම. | 2023 අප්‍රේල් 30 දිනට පෙර |
| 06. | භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත යොමු කිරීම | 2023 මැයි 15 දිනට පෙර |
| 07. | 2022 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සම්බන්ධ කටයුතු ඉහත 01 - 06 පරිදි කාර්ය නිම කළ බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) වෙත දැනුම් දීම. | 2023 ජුනි 15 දිනට පෙර |

**03.භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම හා වාර්තා ඉදිරිපත් කිරීම**

**03.i** සියළුම රෝහල් / ආයතන විසින් පළාත් මූල්‍ය රීති 474 ප්‍රකාරව බඩු ලේඛණ පොත් තුලනය කල යුතු අතර , 2022.12.31 දිනට රෝහල් / ආයතනයන්ට අදාල බඩු ලේඛණපත් තුලනය කිරීම අනිවාර්යයෙන් සිදු කරන ලෙස අදාල සියළු නිලධාරීන් දැනුවත් කළ යුතු අතර , ඒ පිළිබඳ ඔබගේ අවධානය යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

**03.II** භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ සංයුතිය පළාත් මූල්‍ය රීති 476 (2) ප්‍රකාරව සිදු කළ යුතු අතර සෑම විටම ආසන්නම සෞඛ්‍ය ආයතනයේ / රෝහලේ නිලධාරීන් පත් කර ගැනීමට කටයුතු කල යුතුය.මෙම මණ්ඩලය නම් කිරීමෙන් පසු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගෙන් අනුමැතිය ලබා ගත යුතුය.

**03.iii** සමීක්ෂණ මණ්ඩල පත් කිරීමට අදාල නම් කිරීම් 2022.11.30 දිනට පෙර වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ලබා දිය යුතුය

**03.iV** 2022 වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ කටයුතු , උක්ත වගුවේ සඳහන් ලේඛණනයේ කාලරාමුව ඇතුලත අවසන් කළ යුතුය. මේ අනුව සමීක්ෂණ කටයුතු උපරිම වශයෙන් මාස 03 ක් ඇතුලත සිදු කළ යුතුය. අනුමත කාල පරිච්ඡේදය තුළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර වාර්තා ඉදිරිපත් කරන ලද සමීක්ෂණ මණ්ඩල නිලධාරීන් සඳහා පමණක් අතිකාල ගෙවීම් සිදු කිරීමට අදාල ප්‍රධානීන් කටයුතු කළ යුතුය. එමෙන්ම අතිකාල සඳහා අනුමැතිය ලබා දීමේදී නියමිත කාල සීමාව තුළ සමීක්ෂණ කටයුතු අවසන් කර වාර්තා ඉදිරිපත් කිරීම පිළිබඳව සලකා බලනු ලබන බව මෙයින් දන්වා සිටිමි.

**03.V** සියළුම රෝහල් / ආයතන වල 2022 වසරට අදාල පොදු භාණ්ඩ, වාහන හා ශල්‍ය භාණ්ඩ සම්බන්ධයෙන් සමීක්ෂණ වාර්තා පිටපත් දෙකකින් සැකසිය යුතුය. රෝහල් / ආයතන ප්‍රධානියාගේ ආවරණ ලිපියක් සමගින් 2023.06.15 දිනට පෙර ඉන් පළමු පිටපත විගණකාධිපති හට යොමු කිරීම සඳහා විගණන අධිකාරී , ප්‍රධාන විගණන කාර්යාලය වෙතටද, දෙවන පිටපත ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට යොමු කිරීමේ කටයුතු සිදු කිරීම වෙනුවෙන් ප්‍රධාන ගණකාධිකාරී පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙතටද ලබා දිය යුතුය.

**03.Vi** ඔබ විසින් ඉදිරිපත් කරන පොදු භාණ්ඩ හා ශල්‍ය භාණ්ඩ වලට අදාල සමීක්ෂණ වාර්තා සමග

සමීක්ෂණය කරන ලද අංශ වල ලැයිස්තුවක්ද ඉදිරිපත් කල යුතු බව දන්වා සිටිමි.

**04. මූල්‍ය නොවන වත්කම්සත්‍ය හා සාධාරණ ලෙස අවසන් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිලත් කිරීම.**

**04.i** දෙපාර්තමේන්තු අවසන් ගිණුම් වල දැක්වෙන මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම හා පැවැත්ම සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය කිරීම සියළු ආයතන ප්‍රධානීන්ගේ වගකීමකි. මේ සඳහා 2022 හා ඊට පෙර සියළු මිලදී ගැනිම් ,පරිත්‍යාග හා වෙනත් ව්‍යාපෘති අංශ මගින් ලබාදෙන මූල්‍ය නොවන වත්කම් අදාල ඉන්වෙන්ට්‍රි ලේඛණ වලට ඇතුලත් කිරීමට සහ Cigas වත්කම් කළමණාකරණ මොඩියුලය මගින් ගිණුම්ගත කිරීමට සෑම ආයතන ප්‍රධානියෙකුම ක්‍රියාකළ යුතු වේ.

**05. පාවිච්චි කළ නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් ක්‍රියාකිරීම.**

**05.i** පළාත් මූල්‍ය රීති 452 ට අනුව පාවිච්චි කළ නොහැකි භාණ්ඩ අපහරණය කිරීමට පත්කරනු ලබන අපහරණ සමීක්ෂණ මණ්ඩලය , වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් හදුනාගත් ,පොදු 47 හි සඳහන් කරන ලද භාණ්ඩ අපහරණය කිරීම පළාත් මූල්‍ය රීති , මුදල් රෙගුලාසි උපදෙස් හා චක්‍රලේඛණ උපදෙස් ප්‍රකාරව සිදු කල යුතුය. මේ අනුව අපහරණ මණ්ඩලය විසින් පොදු භාණ්ඩ , වාහන අමතර කොටස් හා ශල්‍ය භාණ්ඩ සමීක්ෂණය කරන ලද වර්ෂය තුළ හඳුනාගත් ප්‍රයෝජනයට ගත නොහැකි ලෙස සලකන ලද පොදු 47 හි සඳහන් කරන ලද භාණ්ඩ පමණක් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.අදාල මණ්ඩලය සෑහිමකට පත් වන්නේ නම් පමණක් එම භාණ්ඩ විකිණීම හෝ විනාශ කිරීමට නිර්දේශ කළ යුතුය.

**05.ii** ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල ඇතුළු සියළුම රෝහල් / ආයතන වලට අදාල ලිපිගොනු / ලේඛණ , ඇඳ ඉහපත් ආදී ලියවිලි හා ගොනු අපහරණය කරන්නේ නම් , තොරතුරු දැන ගැනීමේ පනතේ සඳහන් විධිවිධාන කෙරෙහි අවධානය යොමු කරන ලෙසද දන්වමි.

මේ සම්බන්ධ වැඩි දුරටත් විස්තර අවශ්‍ය නම්, ප්‍රධාන ගණකාධිකාරීගේ දුරකතන අංක **037 2223231** මගින් විමසීම් කළ හැක.එසේ නැතහොත් ඔබගේ ගැටලුව ප්‍රධාන ගණකාධිකාරීවිද්‍යුත් තැපැල් ලිපිනය ca@healthdept.nw.lk

වෛද්‍ය එම්.කේ.සම්පත් ඉන්දික කුමාර,

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව,

වයඹ පළාත.

වෛද්‍ය එම්.කේ. සම්පත් ඉන්දික කුමාර
MBBS, MSc MD, MCMA
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
වයඹ පළාත,
කුරුණෑගල.

පිටපත්:

01.වයඹ ප්‍රධාන ලේකම් - කා.දැ.පි.
02.ලේකම්, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය වයඹ - කා.දැ.පි.
03.සහකාර විගණකාධිපති - දැ.පි
04.අධ්‍යක්ෂ - පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව - දැ.පි
05.අධ්‍යක්ෂ - ආදායම්, ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ - දැ.පි